SLGURU.LK

*සියළු ම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

| ශ්‍රේණිය Grade | 13 | විෂයය Subject | දේශපාලන විද්‍යාව I | කාලය Time | පැය 02 |
|---|---|---|---|---|---|

## I පත්‍රය

**සැලකිය යුතුයි**

- ✷ **මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය.**
- ✷ **A කොටස බහුවර්ණ ප්‍රශ්න 30 කින් හා B කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කින් යුක්ත වේ.**
- ✷ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුයි.**
- ✷ **එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.**

## A කොටස

- **අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්න වලට නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තිත් ඉර මත ලියන්න.**

01. දේශපාලන විද්‍යා අධ්‍යනය
    (1). දේශපාලන බලය අවභාවිතා කරන්නේ කෙදේසැයි දැන ගැනීමට ආධාර වෙයි.
    (2). නූතන යුගයේ ආරම්භ විය.
    (3). ප්‍රතිමානීය සංකල්ප වලට සීමා වේ.
    (4). සමාජයේ දේශපාලන බලය පවතින්නේ කෙසේදැයි අවබෝධ කර ගැනීමට වැදගත් වේ.
    (5). ක්‍රි.ව. 4 වන සියවසේ ආරම්භ විය. (.............)

02. දේශපාලනය කිරීම,
    (1). ආධ්‍යාත්මිකත්‍වයට බද්ධව පවතී.
    (2). ආණ්ඩුවට බලපෑම් කිරීමෙන් බැහැර වේ.
    (3). මැතිවරණ වලදී ඡන්දය භාවිතා කිරීමට සීමා වේ.
    (4). පුරවැසියන් අතර පවතින සමාජ භාවිතාවකි.
    (5). පක්ෂ දේශපාලනයට සීමා වේ. (.............)

03. ආණ්ඩුව
    (1). ස්වාධිපත්‍ය බලය හිමි අතිමූලික ආයතනයයි.
    (2). ස්ථිර ආයතනයකි.
    (3). සමස්ත සමාජය වෙනුවෙන් තීරණ ගත යුතු වේ.
    (4). මුල්වරට 18 වන සියවසේ පැන නැගුණි.
    (5). සියලු සංවිධාන වලට ඉහලින් සිටී. (.............)


For Educational Purpose Only

SLGURU.LK

04. දේශපාලන විද්‍යා ප්‍රධාන උප විෂය ක්ෂේත්‍රයක් වන්නේ,

(1). දේශපාලන පරමාදර්ශයන්

(2). මිනිසාගේ මතවාදයන්

(3). තුලනාත්මක දේශපාලනය

(4). දේවධර්මවාදය

(5). අධ්‍යන ප්‍රවේශ (.............)

05. ස්ත්‍රීවාදය

(1). ස්ත්‍රී පාසල් තිබිය යුතු බවට යෝජනා කරයි.

(2). සමානාත්මතාව අගය නොකරයි.

(3). ග්‍රීක යුගයේ ආරම්භ වූ මතවාදයකි.

(4). ස්ත්‍රීන් අත්විඳින වෙනස් කොට සැලකීම අවසන් කිරීමට යෝජනා කරයි.

(5). පවුලේ සුබසාධනයේ වැදගත්කම හුවා දක්වයි. (.............)

06. දේශපාලනය චර්යාවාදය,

(1). වර්ධනය වූයේ 18 වන සියවසේ මුල්කාලයේ ය.

(2). දේශපාලන විද්‍යාවේ ප්‍රධාන ප්‍රවේශයක් වූයේ පළමු ලෝක යුධ සමයේ ඇමරිකාවෙහිය.

(3). දේශපාලන විද්‍යාවේ විද්‍යාත්මක හැරවුම විය.

(4). සමාජ පන්ති දේශපාලනය බලපාන ආකාරය විග්‍රහ කරයි.

(5). දේශපාලන විද්‍යාවේ ප්‍රතිමානීව අධ්‍යනය ප්‍රවර්ධනය කරයි. (.............)

07. නූතන ජාතික රාජ්‍ය

(1). සෑමවිටම ප්‍රජාතන්ත්‍රවාදී වේ.

(2). ගෝත්‍රික රාජ්‍ය ක්‍රමයේ අඛණ්ඩ විකාශනයකි.

(3). එක් ජනවාර්ගික කණ්ඩායමකින් සමන්විත වේ.

(4). මධ්‍යගත පරමාධිපත්‍යක් සහිත වේ.

(5). වර්ධනය වූයේ 16 වන සියවසේ නූතන රාජ්‍ය තුළය. (.............)

08. සහ සන්ධීය ආණ්ඩු ක්‍රමය,

(1). ස්වාධීන රාජ්‍යන් අතර ස්වේච්ඡාත්මක ගිවිසුම් මත පදනම් නොවේ.

(2). ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවකින් සමන්විතය.

(3). තනි නීති ක්‍රමයක් සහිතයි.

(4). ස්විස්ටර්ලන්තය එකම උදාහරණයයි.

(5). වර්තමාන ව්‍යවස්ථාවට පෙර ඇමරිකාවේ ක්‍රියාත්මක විය. (.............)

09. ජනාධිපති ආණ්ඩු ක්‍රමය

(1). ව්‍යවස්ථාදායකය හා විධායකය අන්‍යෝන්‍ය වශයෙන් රඳා පවතී.

(2). විධායකය සහ ව්‍යවස්ථාදායක බලතල ඒකාබද්ධ වීමට ඉඩ සලසයි.

(3). විධායක හා ව්‍යවස්ථාදායකය වෙන වෙනම මැතිවරණ වලට අවකාශ සපයයි.

(4). ජනාධිපතිවරයා නාමික නායකයා වේ.

(5). ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයට වගඋත්තර දීමට සලස්වයි. (.............)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

10. පශ්චාත් යටත් විජිත රාජ්‍ය මාදිලිය
    (1). විශාල භෞමික ප්‍රදේශයකින් සමන්විතය.
    (2). යුධ ශක්තිය අතින් දුර්වලය.
    (3). ස්වාධිපත්‍ය විසිරී පැවතින.
    (4). වර්තමාන නිලබල ක්‍රමය ක්‍රියාත්මක විය.
    (5). ඇමරිකානු ජාතික අලාවීන් විසින් න්‍යායාත්මක පදනම සපයනු ලැබීය. (.............)
11. පාලන තන්ත්‍රය
    (1). ආණ්ඩුවට සෑම අතින්ම සමානය.
    (2). ආණ්ඩුවේ මතවාදී සංයුතිය අනුවද ගොඩ නැගේ.
    (3). නායකත්වය වැදගත් සාධකයක් නොවේ.
    (4). රාජාණ්ඩු මේ සඳහා ඇති එකම උදාහරණයයි.
    (5). ආණ්ඩුව හඳුන්වන පර්යාය පදයකි. (.............)
12. 1648 වෙස්ට්ෆේලියානු සාම ගිවිසුම
    (1). ජාත්‍යන්තර සාමය හා ආරක්‍ෂාවට ජාතීන්ගේ සංගමය පිහිටු වීමට බලපෑවේ ය.
    (2). යුරෝපා බලවතුන්ගේ යටත් විජිත පාලනය අවසන් කළේය.
    (3). ගිවිසුම්ගත වූ රාජ්‍යන්ගේ භෞමික දේශසීමාව තීරණය කළේය.
    (4). රාජ්‍යයේ පරමාධිපත්‍ය නොසලකා හැරියේය.
    (5). යුරෝපයේ ආගමික නිදහස සීමා කළේය. (.............)
13. ගැටුම්
    (1). ගැටුම් සැමවිටම නිශේධනීය.
    (2). සමනය කල නොහැකි අරමුණ මගින් ඇති වේ.
    (3). ගැටුම් සමාජ වෙනස් වීමට දායක නොවේ.
    (4). ප්‍රචණ්ඩ ගැටුම් සහමන්ත්‍රණය පරිවර්ථනය කිරීම දුෂ්කරය.
    (5). සමාජ ජීවිතයට අදාල නොවේ. (.............)
14. ජාත්‍යන්තර දේශපාලනයේ ක්‍රියාධරයින් වන්නේ,
    (1). ජාත්‍යන්තර මූල්‍ය සහ සංස්කෘතික සංවිධාන
    (2). බහුජාතික සමාගම් සහ රාජ්‍ය නොවන සංවිධාන
    (3). රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාධරයින්
    (4). දේශපාලන ප්‍රභූන්
    (5). දේශපාලන පක්‍ෂ සහ ප්‍රභූ කණ්ඩායම් ය. (.............)
15. නූතන විදේශ ප්‍රතිපත්තියේ සුජාත මාධ්‍යක් නොවන්නේ,
    (1). රාජ්‍ය තාන්ත්‍රික සේවාව (2). විදේශාධාර
    (3). හමුදා මූලෝපා ය (4). සංස්කෘතික සබඳතා
    (5). ආගම්වලට හරවා ගැනීම. (.............)
16. මැතිවරණ ක්‍රමය මගින් ආරක්‍ෂා නොකල යුත්තේ,
    (1). අර්ථවත්භාවය (2). තරගකාරීත්වය
    (3). නිතර මැතිවරණ පැවැත්වීම. (4). බලතල බෙදීම
    (5). අන්තහ්කරණය (.............)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

17. මහජන පරමාධිපත්‍ය
    (1). රාජ්‍ය බලයේ මූලාශ්‍රය ජනතාවයි.
    (2). සුජාතභාවය ලබන්නේ පාලකයාගෙනි.
    (3). ප්‍රධාන ප්‍රකාශකයා ජෝන් ලොක් වේ.
    (4). සමූහාණ්ඩුවාදයට අදාල නොවේ.
    (5). 16 වන සියවසේ බිහිවූ සංකල්පයකි. (.............)

18. ඇමරිකන් ආණ්ඩු ක්‍රමය
    (1). ආරම්භයේ පටන්ම සංධීය වේ.
    (2). දෘඪභාවයකින් යුක්තය.
    (3). මහජන පරමාධිපත්‍ය මූලික නොවේ.
    (4). නෛතික පුරවැසිභාවය පමණක් ක්‍රියාත්මක වේ.
    (5). සමූහාණ්ඩුවාදය ප්‍රතික්ෂේප කරයි. (.............)

19. ඉන්දියානු සන්ධීය ආණ්ඩු ක්‍රමය,
    (1). සම්භාව්‍ය සන්ධීය මාදිලියට අයත් වේ.
    (2). සමාන බලතල සහිත ප්‍රාන්තවලින් සුසැදි සංගමයකි.
    (3). දැඩි අනම්‍ය සන්ධීය ක්‍රමයක් ලෙස සැලකේ.
    (4). වර්තමානයේ ආණ්ඩුක්‍රමය තුල ෆෙඩරල් ලක්‍ෂණ ශක්තිමත් වෙමින් පවතී.
    (3). ව්‍යවස්ථාදායකයේ කොටසක් වන ලොක් සභාව ප්‍රාන්ත නියෝජනය කරනු ලබයි.
    (.............)

20. න්‍යායාත්මකව සලකා බලන විට රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රාරම්භනය කරනු ලබන්නේ,
    (1). ව්‍යවස්ථාදායකය විසිනි.
    (2). විධායකය විසිනි.
    (3). විශේෂඥ දැනුම සහිත නිලබලකරුවන් විසිනි.
    (4). අධිකරණය විසිනි.
    (3). දේශපාලන පක්‍ෂ විසිනි.

- **අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්න වලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුලත් වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.**

21. යටත්විජිත ලංකාව සඳහා කෝල්බෲක් කැමරන් කොමිසම නිර්දේශ කළේ,
    A. රාජ්‍ය නිර්බාධවාදී ආර්ථිකයකි.
    B. පොදු අධිකරණ ක්‍රමයක් පිහිටුවීමටය.
    C. ආණ්ඩුව මගින් පවත්වාගෙන යනු ලබන සියලු ස්වදේශික පාඨශාලා තහනම් කිරීමටය.
    D. සීමිත බලයක් සහිත ආණ්ඩුවක් ය.
    E. ඒකාබද්ධ ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කිරීමටය.

    (1). ABCD (2). ABCE (3). ABDE (4). ACDE (5). BCDE (.............)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

22. 1910-1924 කාලය තුල ක්‍රියාත්මක කල ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මගින්,

A. මැතිවරණ දේශපාලනය හරහා ආණ්ඩුකරණයට සහභාගිවීමට ජනතාව දොර විවෘත කරනු ලැබීය.

B. අයවැය කටයුතු සඳහා සහය වීමට මුදල් කාරක සභාව පිහිටුවීය.

C. ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජිකයින්ගේ සංඛ්‍යාව අඩු කෙරිණ.

D. ආණ්ඩුකරුගේ බලතල නොවෙනස්ව පවත්වාගෙන යනු ලැබීය.

E. ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජිකයන්ගේ බලතල අනුක්‍රමයෙන් වැඩි කෙරිණ.

(1). ABCD (2). ABCE (3). ABDE (4). ACDE (5). BCDE (.............)

23. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය

A. ස්වදේශික සහ යටත් විජිත නියෝජිතයන්ගෙන් සමන්විත වූ අමාත්‍ය මණ්ඩලයක් පැවතීම.

B. ව්‍යවස්ථාදායක හා විධායක බලතල දෙවර්ගයම පැවරූ ව්‍යවස්ථාදායකයක් තිබීම.

C. සාමාන්‍ය අවස්ථා වලදී නාමික විධායකයෙකු ලෙස ක්‍රියා කළ යුතු බවට අපේක්ෂා කල ආණ්ඩුකාරයෙකු සිටීම.

D. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් විධායක කාරක සභා හතක් පැවතීම.

E. අධිරාජ්‍ය ආණ්ඩුවේ අභිලාෂ වෙනුවෙන් පෙනී සිටි මුර බල්ලන් නමින් හැඳින්වුනු රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු සිටීම.

(1). ABCD (2). ABCE (3). ABDE (4). ACDE (5). BCDE (.............)

24. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නියෝජනය කළ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

A. තෝරාපත් කළ හා නාමකරණයෙන් පත්කල වශයෙන් සාමාජියන් දෙවර්ගයකින් සමන්විතය.

B. නීති සම්පාදනය සම්බන්ධයෙන් හිමි වූ බලය සීමිතය.

C. අග්‍රාණ්ඩුකාරවරයා විසින් ක්‍රියාවට නැංවූ කැඳවීම කල්තැබීම හා විසුරුවා හැරීම යන බලතල වලට යටත් ව ක්‍රියාත්මක විය.

D. බ්‍රිතාන්‍ය කිරීටයේ කැමැත්ත සහිතව නාමික විධායකය තනතුරෙන් ඉවත් කිරීමේ බලය හිමිවිය.

E. නියමිත නිල කාලයට ප්‍රථමයෙන් විසුරුවා නොහැරියහොත් පස් අවුරුදු නිලකාලයක් භුක්ති වින්දේය.

(1). ABCD (2). ABCE (3). ABDE (4). ACDE (5). BCDE (.............)

25. 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව

A. ජනතා පරමාධිපත්‍ය මූර්තිමත් කරයි.

B. ව්‍යවස්ථාදායක බලය උත්තරීතර විය.

C. ජාතික රාජ්‍ය සභාවට සමාන බලතල සහිත වෙනත් ආයතන ඇති කල හැකි විය.

D. ජාතික රාජ්‍ය සභාවට එහි බලතල අත්හළ නොහැක.

E. ව්‍යවස්ථාවට අනුකූල පනත් 2/3 බහුතරයෙන් සම්මත කල හැකිවිය.

(1). ABCD (2). ABCE (3). ABDE (4). ACDE (5). BCDE (.............)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

- **අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැලපෙන පහත වගුවේ දැක්වෙන (1) (2) (3) (4) (5) යන වරණ වලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.**

| අංකය | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍යයි | සත්‍යයි |
| (2) | සත්‍යයි | අසත්‍යයි |
| (3) | අසත්‍යයි | සත්‍යයි |
| (4) | අසත්‍යයි | අසත්‍යයි |
| (5) | සත්‍යයි | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය නිවැරදිව පහදා දෙයි. |

| | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 26 | 1978 ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ බලය උත්තරීතර වන්නේය. | පාර්ලිමේන්තුවේ 2/3 බහුතර බලයෙන් සමස්ථ ව්‍යවස්ථාව පරිච්ජින්න කිරීමේ බලය හිමිකරගෙන සිටී. (.............) |
| 27 | ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ධූරය නිර්මාණය කරන ලද්දේ 1972 ව්‍යවස්ථාවට 1977 වර්ෂයේ සිදුකරන ලද සංශෝධනයකිනි. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වාදීම මගින් ජනාධිපති ක්‍රමයට ගැලපෙන ලෙස සමස්ත ව්‍යවස්ථා ව්‍යුහය වෙනස් කරනු ලැබිණි. (.............) |
| 28 | 1978 ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පලාත් සභා ක්‍රමය හඳුන්වා දෙනු ලැබිණ | පලාත් සභා ක්‍රමය ඉන්දියානු සංධීය ක්‍රමයට සෑම අතින්ම සමානය. (.............) |
| 29 | 1978 මුල් ව්‍යවස්ථාව පාර්ලිමේන්තු මැතිවරණ සඳහා මනාප ක්‍රමය සමග සමානුපාතික නියෝජනය හඳුන්වා දුන්නේය. | සමානුපාතික නියෝජන ක්‍රමය පක්ෂ නායකත්වයේ බලය වර්ණය කළේය. (.............) |
| 30 | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාට වැඩබලන ජනාධිපතිවරයෙකු පත්කළ හැකිය. | ජනාධිපතිවරයාට තම ධූරයෙහි වගකීම සහ කාර්යයන් තාවකාලිකව ඉටුකල නොහැකි අවස්ථාවන්හි ජනාධිපති ධූරයේ කාර්යයන් අඛණ්ඩව සිදුවන බවට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහතික කරයි. (.............) |

## B කොටස

31. ''දේශපාලන විද්‍යාව හැදෑරීම'' යන අදහසට අර්ථ කීපයක් පවතී. ඉන් දෙකක් ලියන්න.

(i). ..............................................................................................................

(ii). ..............................................................................................................

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

32. දේශපාලන හැදෑරීම ආකාර දෙකකි. ඒවා ලියන්න.

(i). ........................................................................................................

(ii). ........................................................................................................

33. ජාන් වැන්ඩන් හා කෙනත් නිව්ටන් ට අනුව දේශපාලනය හැදෑරීමේ ප්‍රයෝජන දෙකක් ලියන්න.

(i). ........................................................................................................

(ii). ........................................................................................................

34. මැතිවරණ ක්‍රමය මගින් ආරක්ෂා කල යුතු මූලික නිර්ණායක 02 ක් ලියන්න.

(i). ........................................................................................................

(ii). ........................................................................................................

35. සීමිත ආණ්ඩුව සංකල්පය වර්ධනය වීමේදී එයට පසු කාලීනව එකතු වූ අංග දෙකක් ලියන්න.

(i). ........................................................................................................

(ii). ........................................................................................................

36. ආණ්ඩුවේ වගවීමට යන්නට මාන දෙකකි. ඒවා ලියන්න.

(i). ........................................................................................................

(ii). ........................................................................................................

37. ලෝකයේ ක්‍රියාත්මක වන පරිවර්තන රාජ්‍ය මාදිලි දෙකක් ලියන්න.

(i). ........................................................................................................

(ii). ........................................................................................................

38. ඇමරිකාවේ ප්‍රාන්ත රාජ්‍ය සම්බන්ධයෙන් මධ්‍යම රජයට පැවරී ඇති බලය කරුණු 04 ක් මත රදා පවතී. ඉන් දෙකක් ලියන්න.

(i). ........................................................................................................

(ii). ........................................................................................................

39. ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයේ පදනම් ලක්ෂණ දෙකක් ලියන්න.

(i). ........................................................................................................

(ii). ........................................................................................................

40. රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීම ආරම්භ කල රට හා රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීමට යොමු වීමට බලපෑ හේතුව ලියන්න.

(i). ........................................................................................................

(ii). ........................................................................................................

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

41. මැක්ස් වෙබර්ට අනුව පරමාදර්ශී නිලබල ක්‍රමයට අනුව නිලබල සංවිධානයක දැකිය හැකි ලක්ෂණ 02 ක් ලියන්න.

(i). ..........................................................................................................

(ii). ..........................................................................................................

42. අධිකරණයේ ස්වාධීනත්වය බහුමානීය සංකල්පයකි. එහි ප්‍රධාන කොන්දේසි දෙකක් ලියන්න.

(i). ..........................................................................................................

(ii). ..........................................................................................................

43. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සමස්ථ සාමාජිකයන් සංඛ්‍යාව හා ඊට නිලබලයෙන් පත්වන තනතුරක් ලියන්න.

(i). ..........................................................................................................

(ii). ..........................................................................................................

44. පාර්ලිමේන්තු සභාවේ සංයුතිය හා එහි ප්‍රධාන කාර්ය ලියන්න.

(i). ..........................................................................................................

(ii). ..........................................................................................................

45. ලෝකයේ ක්‍රියාත්මක කරනු ලබන මැතිවරණ ක්‍රම දෙකක් ලියන්න.

(i). ..........................................................................................................

(ii). ..........................................................................................................

46. ශ්‍රී ලංකාව තුල (I) සීමිත ඡන්ද බලය හා (II) සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ දෙක ලියන්න.

(i). ..........................................................................................................

(ii). ..........................................................................................................

47. ගැටුම් වල සාධනීය කාර්යයන් දෙකක් ලියන්න.

(i). ..........................................................................................................

(ii). ..........................................................................................................

48. ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයා හා පත්කරන්නේ කවුරුන් විසින්ද ජනාධිපතිවරයාගේ නිලකාලය ලියන්න.

(i). ..........................................................................................................

(ii). ..........................................................................................................

49. 19 වන සංශෝධනය යටතේ ස්වාධීන කොමිෂන් සභා නවයක් පිහිටුවන ලදී. ඉන් දෙකක් ලියන්න

(i). ..........................................................................................................

(ii). ..........................................................................................................

50. ප්‍රංශයේ ඩිගෝල් ආණ්ඩුක්‍රමය හඳුන්වා දුන් ව්‍යවස්ථාව හා ජනාධිපතිවරයා තෝරා ගැනීමට භාවිතා කරන ඡන්ද ක්‍රමය ලියන්න.

(i). ..........................................................................................................

(ii). ..........................................................................................................

SLGURU.LK

For Educational Purpose Only

“The beautiful thing about learning is that nobody can take it away from you.” — B.B. King

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 13 | විෂයය Subject: දේශපාලන විද්‍යාව II | කාලය Time: පැය 03 විනාඩි 10 |

**උපදෙස් ඃ- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය.**

**I කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්ද,**

**II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද,**

**III කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්ද**

**වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම පිළිබඳ විස්තර කරන්න. (ල. 20)

02. දේශපාලන විද්‍යා උප විෂය ක්ෂෙත්‍රයක් වන දේශපාලන දර්ශනය දේශපාලන විද්‍යාවට වැදගත් වන ආකාරය සාකච්ඡා කරන්න. (ල. 20)

03. පහත සඳහන් මාතෘකා පිළිබඳ විස්තර කරන්න.

(i) පාලන තන්ත්‍රය (ල. 10)

(ii) රාජ්‍ය හා ස්වාධිපත්‍ය (ල. 10)

## II කොටස

04. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් හඳුන්වා දුන් විධායක කාරක සභා ක්‍රමයේ යහපත් අයහපත් භාවය පිළිබඳ සාකච්ඡා කරන්න. (ල. 20)

05. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාලව පහත සඳහන් අංග දෙකක් පිළිබඳ සාකච්ඡා කරන්න.

(i) සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ මූලික ලක්‍ෂණ

(ii) සෙනෙට් මණ්ඩලය ඇති කිරීමේ අරමුණු

(iii) පාර්ලිමේන්තු පරමාධිපත්‍ය

(iv) සුළු ජාතික රැකවරණය සඳහා ගත් ක්‍රියාමාර්ග

(ල. 10 x 2)

06. සෝල්බරි ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට පසුබිම් වූ හේතු පිළිබඳ විග්‍රහ කරන්න.

(ල. 20)



SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

07. ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට අදාලව පහත සඳහන් තේමා සාකච්ඡා කරන්න.

(i) ජනාධිපතිවරයාගේ බල කේන්ද්‍රිය ස්වභාවය

(ii) ව්‍යවස්ථාදායකයේ පරමාධිපත්‍ය බලයේ ස්වභාවය

(ල. 10 x 2)

## III කොටස

08. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පැහැදිලි කරන්න.

(i) පස්වන ප්‍රංශ සමූහාණ්ඩු ක්‍රමයේ බලය විමධ්‍යගත කොට ඇති ආකාරය

(ii) ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ අර්ධ සංඝීය භාවය සාකච්ඡා කරන්න.

(iii) ලංකාව පරිවර්ථනීය රාජ්‍යක් බව

(ල. 10 x 2)

09. රාජ්‍ය ප්‍රතිපත්ති ජීවන චක්‍රය පිළිබඳ සාකච්ඡා කරන්න. (ල. 20)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් ලියන්න.

(i) ජාතික දේශපාලන හා ජාත්‍යන්තර දේශපාලනය අතර වෙනස

(ii) නිරාගාමිකවාදය

(iii) දේශපාලන පක්ෂ

(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

(ල. 10 x 2)


SLGURU.LK
For Educational Purpose Only

"The beautiful thing about learning is that nobody can take it away from you." — B.B. King

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.